# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி: (94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணைத்தளம்: www.pubad.gov.lk / Web Site


---

මගේ අංකය / எனது இல / My No: PA/CS/POLICY/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2016.04.22

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>ඒකාබද්ධ සේවා අංශයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ශාඛාවන්හි කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම</u>**

වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් නිලධාරීන්ට ලබාදීම සඳහා ඒකාබද්ධ සේවා අංශයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ශාඛාවන්හි රාජකාරී කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කර ඇත. ඒ අනුව අවශ්‍ය වෙනස් කිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර 2016.05.13 දිනට පෙර එම කටයුතු නිමා කිරීමට සැලසුම් කර ඇත.

02. එම සැලසුම සාර්ථක කරගැනීම සඳහා ඒකාබද්ධ සේවා අංශයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ශාඛාවන්හි දෛනික රාජකාරී කටයුතු තාවකාලිකව නතර කොට අත්‍යාවශ්‍යම හදිසි රාජකාරීන්ට පමණක් සීමා කිරීමට සිදුව ඇති හෙයින් රාජකාරී කටයුතුවල ප්‍රමාදයන් සිදුවිය හැකිය. එබැවින් මෙම කාලසීමාව තුළ මෙම අංශය වෙත ලිපි සහ දුරකථන ඇමතුම් යොමු කිරීම අත්‍යාවශ්‍යම සහ හදිසි කටයුතු සඳහා පමණක් සීමා කරන මෙන් කාරුණිකව ඉල්ලමි. කරුණාකර මේ සම්බන්ධයෙන් ඔබ ආයතනය යටතේ සේවයේ නියුතු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් දැනුවත් කිරීමට ද කටයුතු කරන්නේ නම් මැනවි.

03. ඒ සඳහා ඔබගේ ක්‍රියාකාරී සහයෝගය ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර නව සැලසුම මගින් සේවාලාභීන් වෙත වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමට අපේක්ෂිත හෙයින් එහි අනාගත ප්‍රතිලාභීන් වන්නේ ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් බව ද විශේෂයෙන් සඳහන් කර සිටිමි.

**කේ.වී.පී.එම්.ජේ. ගමගේ**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්